# කැලණිය විශ්වවිද්‍යාලය

## මානව ශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

## භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව 2021 සඳහා අයදුම්පත් කැඳවීම

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කර ගැනීම පිණිස 2021.03.15 සිට 2021.04.23 දින තෙක් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීම සිදු කෙරේ.

මෙම පාඨමාලාව භාෂා පරිවර්ථනය සහ භාෂණ පරිවර්තනය පිළිබඳව සෛද්ධාන්තික දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට සුදුසු වන පරිදි සකස් කර ඇත.

**භාෂා පරිවර්තන පාඨමාලාව :**

I. දෙමළ - සිංහල පරිවර්ථන පාඨමාලාව (සිංහල සහ දෙමළ භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)

II. ඉංග්‍රීසි - සිංහල පරිවර්තන පාඨමාලාව (ඉංග්‍රීසි සහ සිංහල භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)

**පාඨමාලාවේ කාලය :**

අධ්‍යයන වර්ෂ එකකි. (සෙනසුරාද දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා දේශන පැවැත්වේ. රටෙහි පවතින වසංගත තත්වය හේතුවෙන් දේශන අවස්ථානුකූලව මාර්ගගත ක්‍රමයට (online) පන්ති කාමර දේශන වශයෙන් ද කැලණිය විශ්වවිද්‍යාලයේ දී පැවැත්වෙනු ඇත.)

**පාඨමාලා ගාස්තුව :**

රු. 60,000/- කි. (රුපියල් හැට දහසකි)
(පළමු වැනි වාරිකය රු. 35,000.00 ක් ඇතුළත් වීමේ දී හා දෙවැනි වාරිකය රු. 25,000.00 ක් මුල් මාස තුන ඇතුළත ගෙවිය යුතුය.)

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම් :** අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත්වීම.

**පාඨමාලාවට තෝරා ගැනීම :** වාග්විද්‍යා අංශය මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම.

**පාඨමාලාවේ ආරම්භය :** 2021 මැයි

**අයදුම්පත් ගාස්තුව :**

"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව - 2021 අයදුම්පත් ගාස්තුව" යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ, අංක 055-1-001-1-0667549 දරන එකතු කිරීමේ ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු. 750.00 ක් ගෙවා රිසිට් පත ලබාගත යුතුය.

**අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය :**

https://hu.kln.ac.lk/depts/linguistics/index.php/notices යන වෙබ් අඩවියට පිවිස පාඨමාලා අයදුම්පත බාගත කරගත (download) හැකිය. **නැතහොත්**

තැපැල මගින් පාඨමාලා අයදුම්පත ඉල්ලුම් කරන්නේ නම්, ලියුම් කවරයේ වම් කෙළවරේ **"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන පාඨමාලාව 2021 අයදුම්පත් ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. මුදල් ගෙවූ අදාළ බැංකු රිසිට් පත ඉල්ලුම් කරන්නාගේ නම සහ ලිපිනය ලියන ලද රු. 15.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක් 2021.04.10 දින හෝ ඊට පෙර **"සම්බන්ධීකාරක, භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"** යන ලිපිනයට එවීමෙන් ද පාඨමාලා අයදුම්පත ලබාගත හැකිය.

**අයදුම්පත්‍ර යොමු කරන ආකාරය :**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.04.23 දින හෝ ඊට පෙර ලැබෙන සේ **සම්බන්ධීකාරක, භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඉහත කුමන ආකාරයකට හෝ ලබාගෙන සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල ස්කෑන් පිටපතක් (scanned Copy) 2021.04.23 දින හෝ ඊට ප්‍රථම dipintranslation@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතු අතර, අයදුම්පතේ සහ බැංකු රිසිට්පතේ මුල් පිටපත් ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවීම අනිවාර්ය වේ. (බැංකු රිසිට් පත එවිය යුත්තේ වෙබ් පිටුවෙන් අයදුම්පත් ලබාගත් අයදුම්කරුවන් පමණි) අයදුම්පත් එවීමේදී කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව"** යනුවෙන් සඳහන් කළ යුතුය.

බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින් අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.

අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල මත ප්‍රමුඛතාවය හිමිවේ.

පාඨමාලාව සම්බන්ධයෙන් වැඩි විස්තර පහත සඳහන් දුරකථන මගින් ලබාගත හැකිය.

**දුරකථන අංක : 0112-908786 / 0112-908793**

**ලේඛකාධිකාරී**
**කැලණිය විශ්වවිද්‍යාලය.**

**2021.02.24**